ET/SSS/2022(2023)/OL/21/S/Q/S-1

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)


# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Sinhala Language

# සිංහල භාෂාව



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

e තක්සලාව - The National e-learning Portal for The General Education

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 21 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II**
**சிங்களமொழியும் இலக்கியமும் I, II**
**Sinhala Language and Literature I, II**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

| | |
|---|---|
| **අමතර කියවීම් කාලය** | **- මිනිත්තු 10 යි.** |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | – 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I**

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. තම පියා **උන් හිටි ගමන්** රෝගාතුර වීමෙන් දරුවෝ මහත් දුකට පත් වූහ.
   (1) බලවත් සේ (2) එක් තැන් ව
   (3) හදිසියේ ම (4) ඉක්මනින් ම

2. **උඩින් පල්ලෙන්** වැඩ කිරීම නිසා විශාල අලාභ හානිවලට මුහුණ දීමට සිදු වේ.
   (1) නොසැලකිලිමත්ව (2) අලස ලෙස
   (3) දඩ බඩ ගා (4) කරුණු නොවිමසා

3. විවිධ හේතු දක්වමින් පොදු කටයුතුවල දී **කර අරින** මිනිස්සු අද සමාජයේ සිටිති.
   (1) ඉවත් වන (2) උදවු නොවන
   (3) මග හරින (4) බොරු කියන

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. ...................... ආර්ථිකයක් පැවතීම රටක නිවහල්භාවයට තුඩු දෙන ප්‍රමුඛාංගයකි.
   (1) ස්වයංජාත (2) ස්වයංසිද්ධ
   (3) ස්වයංභූත (4) ස්වයංපෝෂිත

5. ලෝක බැංකු සහනාධාර ව්‍යාපෘතිය ................. සඳහා නියෝජිත පිරිසක් ලබන සතියේ දිවයිනට පැමිණේ.
   (1) නියෝජනය (2) නියාමනය
   (3) සම්පාදනය (4) නිවේදනය

6. ඇතැම් කටුසු, මැඩි ආදි සතුන්ට පරිසරයට ................ වීමේ අපූරු හැකියාවක් ඇත.
(1) සම්මිශ්‍රණය (2) පරිවර්තනය
(3) අනුවර්තනය (4) පරාවර්තනය

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) නර්තනය, මර්දනය, ලේකම්, සම්ප්‍රදාය
(2) ප්‍රහල, ප්‍රස්ථාවනාව, වීරෝදාර, බබලන
(3) කණිෂ්ඨ, ආකර්ෂණීය, සිත්කළු, තිළින
(4) පිළිවෙත්, දේශාඨනය, සාමාර්ථය, පරිසණක

8. සුනීල, තරුණ, ඇහැළ, පාෂාණ යන වචනවල **දෙවන අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) දිගු ඉස්පිල්ල, කෙටි ඇදය, කෙටි පාපිල්ල, ඇලපිල්ල
(2) දිගු ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල
(3) දිගුඉස්පිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඇදය
(4) දිගු ඉස්පිල්ල, ඇලපිල්ල, කෙටි ඇදය, කෙටි පාපිල්ල

9. ' ජය ගඟ' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,
(1) දන්තජ, ඕෂ්ඨජ (2) ඕෂ්ඨජ, කණ්ඨජ
(3) තාලුජ, මූර්ධජ (4) තාලුජ, කණ්ඨජ

10. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අළුකෙසෙල්, දඹල, මුරුංගා, රාබු
(2) තම්පලා, නිවිති, කැරට්, කැකිරි
(3) ගෝවා, පිපිඤ්ඤා, වැටකොළු, පතෝල
(4) නෝකෝල්, බෝංචි, වම්බොටු, වට්ටක්කා

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) දියණියෝ, සමහරුන්, වීන්නු, පැටියෙක්
(2) හෙතෙම, හෙදියක්, කර්තෘහු, සමහරු
(3) මිත්‍රයන්, වික්‍රමසිංහයෝ, බිරිඳක, ඔහු
(4) බෑනාවරු, ජීවීන්, රීතීහු, නිලධාරීන්

12. 'අහස් තලෙන් **මරු කතරට** වහින වැස්ස අම්මා' යන කොටසෙහි මරු කතරට යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) සම්ප්‍රදාන (2) අවධි
(3) ආධාර (4) සම්බන්ධ

13. 'ගමන්විධාව' යන්න අයත් වන්නේ,
(1) විශේෂණ සමාසයට ය. (2) ද කාරාර්ථ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය. (4) අන්‍යාර්ථ සමාසයට ය.

14. විද්‍යාලය + ඊය යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) විද්‍යාලීය (2) විද්යාලීය
(3) විද්‍යාලයයීය (4) විද්‍යාලයීය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) සමාස - ගතසිත, මුවතඹර, තුන්බිය, තාරපති
(2) තද්ධිත - මධුරතර, සෙල්මුවා, පිළිමය, දුෂ්කරතා
(3) කෘදන්ත - නරඹන, පිවිසි, යන්නෝ, පැද්දිලි
(4) නිපාත - වෙත, ඉතින්, උදෙසා, පටන්

16. වර්තමාන කාල අවසාන ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?
   (1) තුරු වදුලු සහිත පොළොවේ ජලය රඳා පවතී.
   (2) ඔහු මගෙන් උපකාරයක් පැතී ය.
   (3) පන්දු යවන්නා කඩුලු දෙකක් දවා ගති.
   (4) ගොවියා කුඹුරට ආ සතුන් පලවා හැරියේ ය.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. රෝග **නිවාරණය** සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු බෙහෙවින් හේතු වන්නේ ය.
   (1) බෝ නොවීම (2) හට නොගැනීම
   (3) නැති කිරීම (4) වළක්වා ගැනීම

18. මහාචාර්ය සේනක බිබිලේ ඖෂධ සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම උදෙසා **අපරිමිත** මෙහෙවරක් ඉටු කළේ ය.
   (1) උපමා කළ නොහැකි (2) කිසිවකුට දෙවෙනි නොවන
   (3) ප්‍රමාණ කළ නොහැකි (4) සමාන කළ නොහැකි

19. නාය යෑමෙන් **අවතැන් වූවන්** සඳහා උපකාර කිරීමට දානපතීහු ඉදිරිපත් වෙති.
   (1) මිය ගිය අය (2) නිවාස හැර ගිය අය
   (3) තුවාල ලැබූ අය (4) ගේ දොර අහිමි වූ අය

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
   (1) කමිසය, සාක්කුව, බොත්තම, සපත්තුව
   (2) මල, සමනලයා, රේණු, සුවඳ
   (3) වෙළෙන්දා, පාරිභෝගිකයා, කාසි, ලාභය
   (4) පන්දුව, ක්‍රීඩකයා, විකට්ටුව, විනිසුරු

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| (1) | ගින්න - අනල | පිපුණු - උපුල් | ගොන්ගේ - හරක්බාන | උවම් - උපමා |
| (2) | පරිශ්‍රමය - ප්‍රයත්නය | චංචල - සසල | තුල්‍ය - සමාන | දිළිඳු - දරිද්‍ර |
| (3) | අනූන - නොවැඩි | ඉසුරු - සම්පත | සයුර - මුහුද | නුබ - අහස |
| (4) | තුරු - තාරකා | කුලුණ - කණුව | නිපුණ - දක්ෂ | පහණ - ප්‍රදීපය |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) සමාන - සදෘශ බඳු අයුරු ගැන
   (2) කම්මැළි - කුසීත උදාසීන කඩිසර අලස
   (3) උසස් - උදාර උතුම් අග්‍ර ශ්‍රේෂ්ඨ
   (4) ස්ත්‍රිය - ලලනා ළඳ මහිලා අඟන

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) නියුක්ත - වියුක්ත (2) නිද්‍රාශීලී - ප්‍රබුද්ධ
(3) සදොස් - නිදොස් (4) අතිරේක - අතිරික්ත

24. **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) තොපි, තෙපි පද මධ්‍යම පුරුෂ බහුවචන යි.
(2) ශ, ෂ, ස, හ යනු ඌෂ්මාක්ෂර වේ.
(3) නාසික්‍ය අක්ෂරවලට සඤ්ඤක යන නම ද යෙදේ.
(4) 'මිලමුදල්' යනු සමානාර්ථ යුගල පදයකි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) වාන් දොරටු වසා දැමීමෙන් පහත් බිම් ජලයෙන් රුසක් යට විය.
(2) පුනර්ජනනීය බලශක්තිය නැංවීම විදුලිය කැපීමට අනුබලයකි.
(3) රුසියා - යුක්රේන යුද්ධය ලෝක ආර්ථිකයට මහත් බලපෑමක් කරයි.
(4) ඉන්ධන අර්බුදය සඳහා සමස්ත ප්‍රජාව අවබෝධ වෙයි.

- අංක **26, 27** ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. අනුන්ගේ කාර්යයන් කිරීමට ගොස් අමාරුවේ වැටීම
(1) බල්ලාගේ වැඩය බූරුවා බාර ගත්තා වගේ
(2) බතල කන්න පොල් තේරුවා වගේ
(3) බළලුන් ලවා කොස් ඇට බාවන්නා සේ
(4) ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ

27. ඕනෑවට එපාවට යමක් කිරීම
(1) පරංගියා කෝට්ටේ ගියා වගේ
(2) ලෙඩ කපුටා වැළ කන්නා සේ
(3) උගුරට හොරා බෙහෙත් කන්නා සේ
(4) කළුවා මාරපන් ගියා වගේ

28. නිලුපුල්, දැගසවු යන පද අයත් සන්ධි විධි පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) පරස්වර ලෝප සන්ධිය හා ද්විත්ව රූප සන්ධිය
(2) ස්වරාදේශ සන්ධිය හා ආගම සන්ධිය
(3) ස්වර සන්ධිය හා ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
(4) ස්වර සන්ධිය හා ස්වරාදේශ සන්ධිය

- අංක **29, 30** යටතේ දක්වා ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) නවක සිසුන් සාදරයෙන් පිළිගනු ලැබේ.
(2) අද සියලු ම සේවකයෝ සේවයට වාර්තා කොට ඇත.
(3) අපි හැම ලක්මැණියන්ගේ දරුවෝ ය.
(4) වන අලින් විසින් විදුලි වැට බිඳ දැමුණාහ.

30. (1) සිසු දරුදැරියෝ ත්‍යාග ලබා ගත්තේ විදුහල්පතිතුමිය අතිනි.
(2) අම්මා ද තාත්තා ද මම ද ඥාතියකු බැලීමට ගියෙමු.
(3) සමහරු ගී ගයද්දී ඇතැමෙකු නැටූහ.
(4) ක්‍රීඩකයෝ ප්‍රේක්ෂකයන් පිනවයි.

31. ★යහපත් ගතිගුණ ............ හෙතෙම සමාජයේ ජනප්‍රිය විය.
★ උදාර නායකයෝ සමාජ ශුභසිද්ධිය ............ කටයුතු කරති.
★ ............. යුදබිමට එක්වන්නැයි හමුදා බණ්ඩයට අණ ලැබිණ.
★ අට හැවිරිදි වියේ දී .......... ඔහු ක්‍රීඩා දිවිය ඇරඹුවේ ය.

(1) තකා, නිසා, වහා, පමණ (2) නිසා, තකා, වහා, පමණ
(3) නිසා, වහා, තකා, පමණ (4) පමණ, තකා, වහා, නිසා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

''සින්දුව කියපු ගෑනු ළමයාට හැමෝ ම ප්‍රශංසා කළා''

(1) ගීතය කියූ දැරියට හැමෝ ම ප්‍රශංසා කළහ.
(2) සින්දුව ගයපු දැරියට සියල්ලන් ම ප්‍රශංසාව පුද කළේ ය.
(3) ගීතය ගැයූ දැරියට සියල්ලෝ ම ප්‍රශංසා කළහ.
(4) ගීතය ගායනා කළ දැරිය හැමෝගෙ ම ප්‍රශංසාව ලැබුවා ය.

33. පහත දැක්වෙන කාව්‍ය ඛණ්ඩයේ තුන්වන පේළිය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

නන්නාදුනන මෙනුවර තනිවුන අපට
ඉන්නේ කවුද රැකවරණෙට බැල්මකට
.......................................................................
යම් දෝ හෙට උදේ අපි ආපසු ගමට

(1) මට මගේ කඳුළු සීතල විඳගන්න
(2) කට පුරා පුතේ කියනා හඬ අහන්න
(3) දරුවනේ උදේ වෙන කල් නාඩන්න
(4) වන්දෝ බිලින්දෝ නාඩා නැළවෙන්න

34. නිර්මාණය හා නිර්මාණකරුවා නිවැරදි ව **නොදැක්වෙන** වරණය කුමක් ද?
(1) කුකුළු හැවිල්ල - රැපියෙල් තෙන්නකෝන්
(2) සිනා කුමරි - මහගම සේකර
(3) හැංගි මුත්තං - විමල් දිසානායක
(4) මගේ රාජ්‍යය - මායා රංජන්

35. නීල ගොයම් කිරි වැදිලා
රන් අස්වනු නෙළන දාට
නගෝ අපට ඇඹුල අරං
වෙලට වරෙන්නේ

ඉහත සඳහන් වන්නේ කාව්‍ය කොටසකි. එම කාව්‍ය නිර්මාණයේ රචකයා වන්නේ.
(1) මහගම සේකර ය. (2) ගුණදාස අමරසේකර ය.
(3) පරාක්‍රම කොඩිතුවක්කු ය. (4) විමල් දිසානායක ය.

36. '' ඔබ ඉන්දියාවේ සිටියේ නම් දෙවියකු සේ සලකා වන්දනා කරනු ඇත.'' මේ ප්‍රකාශය කවරකු වෙනුවෙන් කරන ලද්දක් ද?
(1) මහාචාර්ය සේනක බිබිලේ (2) මහාචාර්ය සෙනරත් පරණවිතාන
(3) ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් (4) ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර

37. උපමාවක් ඇතුළත් නොවන උත්තරය තෝරන්න.
   (1) බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙළෙන වට
   (2) නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
   (3) ඉසි වැනි නිමල් මලිගිය මල්සිය දිමුත
   (4) සුනෙර මතින් අලළන සඳ කිරි සයුර

38. විශේෂණ පද එකක් පමණක් යෙදුණු වරණය තෝරන්න.
   (1) ලංකාව ආකර්ෂණීය සුන්දර දිවයිනකි.
   (2) වනපෙත දුර්ලභ වටිනා වෘක්ෂයන්ගෙන් යුක්ත ය.
   (3) සුළඟින් පිවිසෙන්නේ ඉමිහිරි සුවඳකි.
   (4) සිංහලය සුලලිත සුබනමා‍ය සුමධුර භාෂාවකි.

39. හේන් වහරෙහි 'අලියන් වෙලාව' යනු,
   (1) අඳුර වැටෙන වෙලාවයි (2) අලුයම් කාලයයි
   (3) අලි එන වේලාවයි (4) උදය කාලයයි

40. ' බස දන්නා සියලු දෙනා ම කාව්‍යයේ රස විඳිතත් තමා විඳි රසය කෙබන්දක් දැයි ප්‍රකාශ කිරීම වූකලී හැම දෙනාට ම කළ හැක්කක් නොවේ.'

   ඉහත ප්‍රකාශයේ අදහස නිවැරදි ව කියැවෙන වාක්‍යය තෝරන්න.
   (1) බස දත් පමණින් කවි රස විඳීමට මෙන් ම තමා විඳි රසයේ ස්වභාවය පළකිරීමටත් නොහැකි ය.
   (2) කාව්‍ය රස විඳින සියල්ලන්ට ම තමා විඳි රසය කෙබඳු දැයි කිව නොහැකි ය.
   (3) තමා විඳි රසය ප්‍රකාශ කිරීමට භාෂාව දැන ගැනීම බෙහෙවින් උපකාරි වෙයි.
   (4) කාව්‍ය රස විඳින සියල්ලෝ ම බස දන්නා අය නො වෙති.

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 21 | S | I, II |
|---|---|---|

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
**சிங்களமொழியும் இலக்கியமும் I, II**
Sinhala Language and Literature I, II

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය II**

- ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1 . (I) සිට (X) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්

(අ) ඕෂ්ඨජ අක්ෂරයක්

(ආ) අර්ධ ස්වරයක් ලියන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

වෛද්‍ය විශේෂඥයන් අවස්ථාවෝචිත ව ගත් තීරණය ඇතැම් පාලකයෝ නිශ්ප්‍රභ කළහ.

(iii) පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේදය නම් කරන්න.

(අ) අප්‍රමාණ

(ආ) දසරජදම්

(iv) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) සලකුණු කරන ලද

(ආ) මැනවින් සංයෝග කිරීම

(v) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) ත්‍රිපිටක දහම

(ආ) විමර්ශන ඇස

(vi) පහත සඳහන් පද විසන්ධි කර දක්වන්න.

(අ) වල්ලම්බලම

(ආ) පුනරාගමනය

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදයක් හා කෘදන්ත පදයක් උපුටා ලියන්න.

සිඟිති දුව අත් පා සොලවමින් අසිරිමත් රැඟුමක් ඉදිරිපත් කරයි.

(viii) පහත සඳහන් වාක්‍යයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද ප්‍රවර්ගය නම් කරන්න.

නවකයන් ඒ කටයුත්ත නිම **කරද්දී** පුහුණුකරුවෝ අත්පොළසන් **දෙමින්** බලා සිටියහ.

(ix) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) ජංගම

(ආ) උල්ලංඝනය

(x) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයටත් කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයටත් හරවන්න.

(අ) විදේශිකයෝ සංචාරක මාර්ගෝපදේශකයාගේ සහාය ලබා ගනී.

(ආ) විනිසුරුතුමා විසින් චූදිතයෝ නිදොස් කොට නිදහස් කරන ලදහ.

(ලකුණු 02 x 10= 20 යි)

2 . පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න. ඔබ (ඊ) තෝරා ගන්නේ නම් ඒ යටතේ ඇති විස්තරය ආරම්භය ලෙස යොදා ගනිමින් නිර්මාණාත්මක රචනයක් ගොඩනගන්න.

අ) ශ්‍රී ලංකාව විදේශ විනිමය උපයා ගැනීමේ අර්බුදයකට මුහුණ දී සිටින තුන්වන ලෝකයේ රටවල් අතුරෙන් එකකි. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම එකී අර්බුදයට යම් විසඳුමක් ලබා දිය හැකි හා ඍජුව ම විදේශ විනිමය ලංකාවට ලැබෙන මාර්ගයක් ලෙස හඳුනා ගත හැකි ය. ඒ සඳහා ලෝකයේ අනෙක් රටවල් සමග තරගයකට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය තවදුරටත් අප හඳුනා ගත යුතු ව ඇත. සංචාරක ව්‍යාපාරයේ හිතකර බලපෑම් මෙන් ම අහිතකර බලපෑම් පිළිබඳ ද අවධානය යොමු කිරීම අනිවාර්යයෙන් සිදු විය යුතු ය.

ආ) වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය වැදගත් සන්ධිස්ථානයකට පැමිණ තිබේ. අන්තර්ජාතික මට්ටමේ ක්‍රීඩා ඉසව් නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ අප රටට කීර්තියක් අත් කර දීමට වෙහෙසෙති. ඔවුන් එසේ ජයග්‍රහණ ලබා දී ඇත්තේ දුෂ්කරතා මැද වෙහෙස වී පුහුණු කටයුතුවල නිරත වූ නිසා ය. ක්‍රීඩාව ශරීර සුවතාව වර්ධනයට සේ ම මානසික සුවතාව වර්ධනයට ද ඉවහල් වේ. එබැවින් ක්‍රීඩාවේ මුඛ්‍ය පරමාර්ථය විය යුත්තේ සැමවිට ම ජයග්‍රහණය ලැබීම පමණක් නොවේ .

ඉ) රටේ පවතින සමාජ ආර්ථික අර්බුද තත්ත්වය හමුවේ බොහෝ ශ්‍රී ලාංකිකයෝ විදේශ රැකියා සඳහා පිටත් වීමට උත්සාහ ගනිති. ඒ සඳහා නීත්‍යානුකූල ක්‍රමවේද සේ ම නීත්‍යානුකූල නොවන ක්‍රමවේද ද අනුගමනය කරන බව මාධ්‍ය මගින් අසන්නට ලැබේ. බොහෝ පිරිස් නිසි පුහුණුවකින් හා දැනුවත්භාවයකින් තොර ව විදේශ රැකියා සඳහා පිටත් වීම විවිධ ගැටලු ඇති

කිරීමට හේතු වන බව වාර්තා වේ. විදේශ රැකියා සඳහා යොමු වන පිරිස් තමන්ට මෙන් ම රටටත් ඵලදායී ලෙසත් ගෞරවාන්විත ලෙසත් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

(ඊ) චණ්ඩ හිරු රැස් මහ පොළොව වසා පැතිර තිබුණේ නොසන්සුන් ලෙසිනි. කපා දමා තිබුණු මහා වෘක්ෂ බිම වැතිර සිටියේ සාංකාවෙනි. ගිනි අව්වට පරඬැල් වෙමින් ගිය කොළරොඩු අතර ඒ මේ අත බියෙන් සැරිසරන කුරුල්ලන්ගේ හඬ ඇසුණේ විලාපයක් ලෙසිනි . ඈතින් ඉතිරි වී තිබුණු වන තීරය උස් අහස දෙස බලා සිටියේ කියා ගත නොහැකි කතාන්දරයකට මුල පුරන්නාක් ලෙසිනැයි මට සිතිණි . මම හෙමින් සීරුවේ ඒ වෙත ඇවිද ගියෙමි .

(ලකුණු 25 යි)

(03) පහත දැක්වෙන පාඨය වචන 65 -75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අතීත ශ්‍රී ලාංකික කෘෂි සමාජයේ ගම් බොහෝ දුරට ස්වයංපෝෂිත වූ හෙයින් රට තුළ අභ්‍යන්තර වෙළෙඳාම අද මෙන් පුළුල් ලෙස නොපැවතිණ. කෙසේ වුව ද ලුණු වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වෙරළබඩ ප්‍රදේශවල සිට රට තුළට ගෙනවුත් බෙදා හරින ලද්දේ වෙළෙඳුන් විසිනි. මේ හැර සමහර ප්‍රදේශවල පමණක් වැවුණු ඉඟුරු වැනි කුළු බඩු වර්ග බෙදා හැරීමේ දීත් ඇතැම් ප්‍රදේශවල පමණක් නිෂ්පාදනය කෙරුණු රෙදිපිළි බෙදා හැරීමේ දීත් ස්ත්‍රීන්ට අවශ්‍ය ආභරණ පලඳනා ගැනීමේ දීත් රට තුළ වෙළෙඳුන්ගෙන් ප්‍රමාණවත් කාර්ය කොටසක් ඉටු විය. නගරවල විසූ ප්‍රභූන්ගේ ප්‍රයෝජනය සඳහා විදේශිකයන්ගෙන් ගෙන එන ලද සුවඳ විලවුන්, වටිනා රෙදි පිළි නගර වෙත ගෙන ඒමත් විදේශ වෙළෙඳාමට අවශ්‍ය ඇතැම් ද්‍රව්‍ය රට තුළින් එකතු කිරීමත් වෙළෙඳුන් අතින් සිදු විය .

අභ්‍යන්තර වෙළෙඳාම නගරවල බෙහෙවින් සාර්ථක ලෙස පැවතිණ . පොලොන්නරුවේ ඇතැම් වීදි, වෙළෙඳසල් සඳහා වෙන් කර තිබූ බවත් එම වෙළෙඳසල්වල ඕනෑ ම භාණ්ඩයක් දක්නට තුබූ බවත් වංශ කථාව දක්වයි. පොලොන්නරු රාජධානිය පිරිහී ගිය පසු රාජධානියක් ලෙස ටික කලක් පැවති කුරුණෑගල නගරයේ වෙළෙඳ වීදි දක්නට තිබූ බව කුරුණෑගල විස්තරය නම් පුස්කොළ පොතේ සඳහන් වේ. ප්‍රධාන නගරවලට අමතර ව රට තුළ භාණ්ඩ අලෙවි කරන ලද වැදගත් ස්ථාන වූයේ නිගම හෙවත් නියම්ගම් නම් වෙළෙඳ නගර ය.

(ලකුණු 10 යි)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ලේඛකයන් විසින් වාර්තාගත කරන ලද ලියවිලි ගොන්නකට පොදුවේ 'ලේකම්මිටි' යන්න ව්‍යවහාර විය. මේවා ලිවීම සඳහා පුස්කොළ භාවිත කර ඇත. මහනුවර යුගයේ දී මධ්‍යම හා ප්‍රාදේශීය පාලනය සඳහා උපයෝගී කර ගත් රාජ්‍ය ලේඛන පොදුවේ ලේකම්මිටි නමින් හැඳින්වේ.

මෙම ලේඛන සම්ප්‍රදායට අයත් විහාර හා දේවාලවල තොරතුරු දැක්වෙන ලේකම්මිටිත් පෞද්ගලික ස්වරූපයේ ලේකම්මිටිත් දැකිය හැකි ය. මේවා රාජ්‍ය ලේඛන වශයෙන් නොසැලකේ. රාජ්‍ය සේවා ඉටු කරවා ගැනීම මෙම ලේකම්මිටි අනුසාරයෙන් සිදු විය. මහලේකම් නමින් හැඳින්වූ රජ්ජුරුවන්ට වග කියන ලේකම්වරයා හාරයේ රාජ්‍ය පාලනයට අදාළ ප්‍රධාන ලේකම්මිටි පවත්වාගෙන ගිය අතර

ප්‍රාදේශීය පාලනයට අදාළ ලේකම්මිටි දිසාවේවරුන් යටතේ පවත්වාගෙන යනු ලැබිණි. රාජ්‍ය ලේඛන වශයෙන් මේවා බෙහෙවින් අගය කළ හැකි ය.

ලේකම්මිටි නමින් පිළිගත් රාජ්‍ය ලේඛන සකස් කිරීම, යාවත්කාලීන කිරීම, ඒවා අනුසාරයෙන් ආදායම් හා සේවා ඉටු කරවා ගැනීම මධ්‍යතන යුගයේ දෙවෙනි භාගයේ ක්‍රමවත් ව සිදු වී ඇත. එකල භාවිත වූ විවිධ නම්වලින් ලේකම්මිටි අනුව රාජ්‍ය පාලනයට උපයෝගි කර ගත් මෙම ලියකියවිලිවල වැදගත්කම නිගමනය කළ හැකි ය.

I. ලේකම්මිටි යනු මොනවා දැයි හඳුන්වා දෙන්න.

II. රාජ්‍ය පාලනයට හා ප්‍රාදේශීය පාලනයට අදාළ ලේකම්මිටි පවත්වා ගෙන නිලධාරීන් දෙදෙනා වෙන වෙන ම දක්වන්න.

III. ලේකම්මිටි අනුසාරයෙන් සිදු වූ කාර්යයක් දක්වන්න.

Iv. රාජ්‍ය ලේඛන සේ නොසලකන ලේකම්මිටි වර්ග දෙකක් දක්වන්න.

v. ලේකම්මිටි සම්පාදනයේ හා ඒවායින් සේවා ඉටු කර ගැනීමේ ක්‍රමවත් බවක් ඇති වූයේ කවර කාල වකවානුවක දැයි දක්වන්න. (ලකුණු 02 X 05= 10 යි)

5. පහත දැක්වෙන විස්තරය පදනම් කර ගෙන **ආරාධනා පත්‍රයක්** සකස් කරන්න.

ගඟසිරිපුර තරුණ කවි සමාජය තම සංවිධානයට වසර සියයක් සපිරීම නිමිති කොට ගෙන දිවයින පුරා විසිර සිටින කවි කිවිඳියන් සහභාගි කර ගනිමින් හිටිවන කවි තරගයක් පැවැත්වීමට කටයුතු සූදානම් කොට ඇත. 2023 නොවැම්බර් 20 වන දින පෙ.ව 8.00 සිට 12.00 දක්වා ගඟසිරිපුර තරුණ කවි සමාජීය රැස්වීම් ශාලාවේ දී එම කවි තරගය පැවැත්වීමට අපේක්ෂිත ය. ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග හා සහතික පත්‍ර පිරිනැමීමට ද කවි සංවිධානය සඳහා නවක සාමාජික සාමාජිකාවන් බඳවා ගැනීමට ද සංවිධායක කමිටුව තීරණය කොට ඇත. මෙම අවස්ථාව සඳහා සහභාගි වන ලෙස දන්වමින් කවියට ළබැඳි සහෘදයන් වෙත යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න. (ගඟසිරිපුර තරුණ කවි සමාජයේ ලේකම් කවීශ්වර ජයසේකර ඔබ යැයි සිතන්න).

**නැතහොත්**

පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන **පුවත්පත් වාර්තාවක්** සකස් කරන්න.

පසුගිය දා නිමාවට පත් වුණු දකුණු ආසියා ක්‍රීඩා උළෙලේ දී හෙල්ල විසි කිරීමේ තරගයෙන් රන් පදක්කමක් දිනා ගත් දිනාල් දේශප්‍රිය ක්‍රීඩකයා පිළිගැනීමේ උත්සවයක් 2023 මැයි 22 දින පෙ.ව 8 සිට 10 දක්වා නවසෙත්පුර විද්‍යාදාන විද්‍යාලයේ ක්‍රීඩා පිටියේ දී පැවැත්විණි. එහි දී දිනාල් ක්‍රීඩකයා වෙනුවෙන් උපහාර පිරිනැමීම හා ඔහු වෙනුවෙන් ඉදි කළ නව නිවස පරිත්‍යාග කිරීමත් සිදු කෙරිණි. ක්‍රීඩාලෝලීන් රැසකගේ සහභාගිත්වයෙන් පැවති මෙම උපහාර උලෙළ සංවිධානය කරනු ලැබුවේ නවසෙත්පුර ක්‍රීඩා සමාජය විසිනි. (ඒ සඳහා සහභාගි වූ පුවත්පත් වාර්තාකරු සමුද්‍ර මහාදේවගේ ඔබ යැයි සිතන්න).

(ලකුණු 15 යි)

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

| 21 | S | III |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II**
**சிங்களமொழியும் இலக்கியமும் I, II**
**Sinhala Language and Literature I, II**

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**

වැදගත්: උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- . මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) **තෙක් ඇති සියලු ම අනුකොටස්වලට උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "මනුෂ්‍යයෝ ඔල්වර හඬ දෙන්නාහු අත්පොළසන් දෙන්නාහු පනන්නාහු 'වටලා ගතුම්හ' යන සමාධියෙන් නටමින් ගර්ජනා කරමින් සිට ගත්හ"
(අ) මේ පාඨය උපුටා ගත් කතා වස්තුව රචනා කිරීමේ අරමුණ කුමක් ද?
(ආ) මෙහි සඳහන් වටලා ගත් නගරයේ නම කුමක් ද?

(ii) "යොදා සවන් වෙණ නද රස සුලබව
නඳා එකඟ සිත් වත නො ම සකොබව
-----------------------------------------------------------------
එදා ගියේ රිළවුන් සන්සල බව"

(අ) මේ කවියෙහි තෙවන පදය සම්පූර්ණ කරන්න.
(ආ) ගුත්තිල කාව්‍යයේ ආරම්භය කවියාට අනිටු විපාක ගෙන දෙන්නක් ලෙස සැලකුයේ ඇයි?

(iii) (අ) 'දියමන්ති මාලය' කෙටිකතාව ලියා තිබෙන්නේ කවර දෘෂ්ටි කෝණයෙන් ද?
(ආ) එහි මුල් රචකයා ලියා ඇති කෙටිකතා ප්‍රමාණය කවරේ ද?

(iv) "රාලහාමි, ඇත්තට ම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද?"
(අ) මෙහි රාලහාමි යනු කවරෙක් ද?
(ආ) මෙම කොටස උපුටා ගත් ග්‍රන්ථයේ මුල් රචකයාගේ බිරියගේ නම කුමක් ද?

(v) "රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න
වැහිවතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට"

(අ) මේ කවිය උපුටා ගත් කවි පෙළේ රචකයාට හිමි වූ විදේශ සම්මානය කුමක් ද?
(ආ) ඔහුට රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි වූ කාව්‍ය සංග්‍රහයක් නම් කරන්න.

(vi) (ආ) 'ගංගාවේ සංගීතය' කවි පෙළෙහි රචකයා විසින් සංස්කරණය කරන ලද කවි සඟරාවක් නම් කරන්න.
(ආ) 'සිංහල ෂෙලී' යන අන්වර්ථ නාමයෙන් එම කවියා හැඳින්වූයේ ඇයි?

(vii) "තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
-----------------------------------------------------
මෙලොවට කිසි පලක් නැතේ

(අ) මෙම කවියේ තෙවන පදය සම්පූර්ණ කරන්න.
(ආ) එස් මහින්ද හිමිට පළමුව පැවිදි බව ලබා දුන් ගුරු හිමියන්ගේ නම කුමක් ද?

(viii) "පටහැනි වන්ටා නො ව ඔහු අණටා
වෙන මග ගැලවෙන්ටා
නො පෙනෙන කලටා සැරසෙනු කුමටා
මා දූන් වළකන්ටා"

(අ) මෙහි සඳහන් කොටස උපුටා ගත් නිර්මාණයට පාදක වූ කතා පුවත ගෙන ඇති මූලාශ්‍රය කුමක් ද?
(ආ) එහි රචකයාට භාරතයෙන් හිමි වූ සම්මානයේ නම කුමක් ද?

(ix) "දසේ කඳුළැලි පිස දා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ"

(අ) මෙම කොටස උපුටා ගත් නිර්මාණයෙහි රචකයා විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍යයක නම ලියන්න.
(ආ) ඔහුට ආචාර්ය උපාධිය පිරිනැමුණු නිබන්ධයේ නම කුමක් ද?

(x) "දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතු ය
----------------------------------------------------------------------
මහත් තුරු මියුරු පල ගෙන නැමී අතු ය
රැගත් සෙවණ නො හැර ම සිටි පොල් වතු ය"

(අ) මෙහි දෙවෙනි කවි පදය සම්පූර්ණ කරන්න.
(ආ) රසවාහිනියේ කැරගල නම් කොට ඇත්තේ කවර නමකින් ද?

(ලකුණු 02 x 10 = 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "**<u>මිහ'ඹ</u>** මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලබ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
**<u>කිරඹ</u>** පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට"

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි ඇතුළත් රූපකාලංකාරයක් ලියා දක්වන්න.

(ii) "සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නො සතුට"

(අ) මේ පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.
(ආ) මෙහි සඳහන් අය සතුටින් සිටින්නේ ඇයි?

(iii) "එහෙයින් දිවසින් බලනුවෝ ප්‍රාර්ථනාව තෙල ලෙසින් ම සමෘද්ධ වන නියාව දැන සිනා පහළ කළහ. දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණත් විචාරා නොපියා සමණාණන්ට මුත් වහන්සේ සිනාවක් සීපී සේක...."
(අ) මෙය ඇතුළත් අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.
(ආ) සමෘද්ධ වන ප්‍රාර්ථනාව කුමක් ද?

(iv) "මල්දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි
කල් ගිම් නිවා **<u>සැනහෙන</u>** සිහිලස **<u>රසිනි</u>**
කොල්ලම් ගසින් නිල් ඉවුරැති පොකුණසිනි
වල් අම්බලම දැක යා ගන් සහතොසිනි"

(අ) පොකුණෙන් ප්‍රයෝජන ලැබුවෝ කවරහු ද?
(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

(v) "ආචාරිනී, උපාය නම් තමා කිම් ද? මේ සා මහත් වූ තොපගේ උපායෙකින් වැඩකුත් නිමාවකුත් දුටු ද නැති."
(අ) මේ ප්‍රකාශය ඇතුළත් අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.
(ආ) මේ ප්‍රකාශය ශ්‍රවණය කරන්නා මෙයට දක්වන ප්‍රතිචාරය කුමක් ද?

(ලකුණු 04 x 05 = 20 යි)

3. සද්ධර්මරත්නාවලියේ සාර්ථකත්වයට එහි
- භාෂා විශේෂතාවත්
- අවස්ථා නිරූපණයත් බලපා තිබේ.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් 'උග්ගසේන සිටු පුත්හුගේ කතා වස්තුව', ඇසුරෙන් විස්තර කරන්න.

**නැතහොත්**

ගුත්තිල ඇදුරුතුමාගේ වීණා නාදයේ මිහිරියාව නිසා
- සත්ත්ව චර්යා වෙනස් වීම හා
- මානව චර්යා වෙනස් වීම

කවියා විසිතුරු ලෙස වර්ණනාවට ලක් කරයි. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් 'ගුත්තිල වෙණ නද' පාඩම ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

4. සැළලිහිණි සන්දේශය රසවත් නිර්මාණයක් වී ඇත්තේ
- අර්ථ රසයෙන් හා
- ශබ්ද රසයෙන් සමන්විත වීම යන දෙකරුණ නිසා ය.

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් 'මග විසිතුරු' පැදි පෙළ ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

- කාව්‍යාත්මක භාෂාවක් යොදා ගැනීම
- අපූර්ව පරිසර වර්ණනා තිබීම හේතුවෙන්

වස්සානේ පද්‍ය පන්තිය රසිකානන්දයට හේතු වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15 යි.)

- **5, 6, 7** ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

5. බැද්දේගම ගම්වැසියන් ක්‍රමයෙන් පිරිහී යන ජන කොට්ඨාසයක් බව සජීවී ලෙස නිරූපණය වීමට උචිත භාෂාවක් යොදා ගැනීම හේතු වී ඇත. නියමිත කොටසින් උදාහරණ **තුනක්වත්** දෙමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

6. "අන්‍යෝන්‍ය අවබෝධය හා ආදරය ලොයිසල්ගේ චරිතයේ විශේෂ ලක්ෂණයි". නියමිත කෙටිකතාවෙන් උදාහරණ **තුනක්වත්** දෙමින් විමසන්න. (ලකුණු 10 යි.)

7. ජනකවියට ආවේ සරල අව්‍යාජ ගැමි කටවහර "කුරහන් ඉසිමුව" පැදි පෙළෙන් ද ප්‍රකට වෙයි. උචිත නිදසුන් **තුනක්** දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

*****